# 8 ශ්‍රේණිය සිංහල

## 03 ඒකකය - 2022

# අලුත් අවුරුදු උත්සවය



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

08 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 03. අලුත් අවුරුදු උත්සවය



මානවයා ජීවිතයේ දී විවිධාකාර උත්සව පවත්වති. එබඳු උත්සව දෙයාකාර වේ. අලුත් අවුරුදු උත්සවය මේ අතරින් දෙවන වර්ගයට අයත් ය.

I. ජීවිතයේ වැදගත් අවස්ථා සමරමින් පවත්වනු ලබන ජීවන සංක්‍රාන්ති උත්සව
II. සමාජයකට අනුගතව සමරනු ලබන උත්සව

මෙහි ඇති විශේෂත්වය වන්නේ දේශීය අනන්‍යතාව පිළිබිඹු වන චාරිත්‍ර මෙන් ම වෙනත් සංස්කෘති නියෝජනය කරන විවිධ සංස්කෘතිකාංග ආශ්‍රය කර ගැනීමෙන් නිර්මාණය වූ චාරිත්‍ර වාරිත්‍ර ද දක්නට ලැබීම යි.

## අවබෝධය

1. 'මිනිසාට විශ්‍රාමය අවශ්‍ය යි' යන හැඟීම ගැබ් වුණු අවුරුදු චාරිත්‍රය කුමක් දැයි විස්තර සහිතව දක්වන්න.
2. පිරිසිදුබව හා නැවුම්බව ප්‍රකට වන අවුරුදු චාරිත්‍ර කිහිපයක් නම් කරන්න.
3. අවුරුදු සිරිත්වල දී දේශීය වෛද්‍ය ක්‍රමයට මුල් තැන ලැබෙන අවස්ථා දෙකක් සඳහන් කරන්න.
4. අවුරුද්දට බුලත් දී වැඳීමේ වැදගත්කම් මොනවා ද?
5. අවුරුදු ක්‍රීඩා කිරීමෙහි අර්ථය ලෙස ඔබ දකින්නේ කුමක් ද?

- **අවබෝධය**

1. නොනගතය, නොනගතය යනු නැකත් නැති වෙලාවයි. එය පරණ අවුරුද්දට හෝ අලුත් අවුරුද්දට අයිති නැති වෙලාවක් නිසා, වඩා පරිස්සම් විය යුතු කාලයක් ලෙස සලකා, ගමේ මිනිස්සු ඒ වෙලාවට පන්සල් යති.

2. පරණ අවුරුද්ද සඳහා ස්නානය, ආහාර පිසීම හා ආහාර අනුභවය, හිසතෙල් ගෑම, අවුරුද්දක් වැඩ ගත්ත ළිප පරණ අවුරුදු දා ගොම මැටි ගා නැවත පිළිසකර කර අලුත් මුට්ටියක අවුරුදු කිරිබත හැදීම, ළිඳ සමඟ ගනුදෙනු කිරීම.

3.

- ✓ ඖෂධීය වටිනාකමක් ඇති ගස්වල කොළ කොටා ඒවායින් මිරිකා ගත් යුෂ වලින් නානු සාදා, නුගපත් මිශ්‍ර නානු ගා, පරණ අවුරුද්ද සඳහා ස්නානය කිරීම.
- ✓ හිස තෙල් ගෑම වෙද සීයා අතින් සිදු කිරීම.

4.

- ✓ අලුත් අවුරුද්දට වැඩිහිටියන්ගේ ආශීර්වාද ලැබීම.
- ✓ යම් වැඩිහිටියකුට වරදක් සිද්ධවෙලා තියනවා නම් ඊට සමාව ගත හැකි වීම.
- ✓ ගම්වල මිනිස්සු අතර ඇති තරහ මරහ අවසන් කර ගත හැකි වීම.

5. යාළු මිත්‍රයන්, නෑදෑයන්, අසල්වැසියන් සමඟ සෙල්ලම් කිරීමෙන් ඔවුන් අතර ඇති එකමුතුකම වැඩි වේ.

## ප්‍රායෝගික අභ්‍යාස (Home Work)

### ප්‍රායෝගික අභ්‍යාස

1. ඔබේ ප්‍රදේශයට විශේෂ වූ සහ පාඩමෙහි සඳහන් සිරිත්වලට වඩා වෙනස් ලෙස සිදු කෙරෙන අවුරුදු සිරිත් විරිත් පිළිබඳ විස්තර එක් රැස් කරන්න.
2. ශ්‍රී ලංකාවේ වෙනත් සංස්කෘතික උත්සව පිළිබඳව ලියවුණු පුවත්පත් හා සඟරා ලිපි එකතු කර පොතක් නිර්මාණය කරන්න.
3. වෙනත් රටක අවුරුදු උත්සවය සමරනු ලබන ආකාරය පිළිබඳව පන්තියේ බිත්ති පුවත්පතට ලිපියක් ලියන්න.
4. වෙනත් සංස්කෘතිවලින් ශ්‍රී ලංකාවේ අවුරුදු සිරිත් අතරට එක් වූ අංග ලක්ෂණ සොයා ලියන්න.
5. අලුත් අවුරුදු සිරිත්වල සමාන අසමානතා සන්සන්දනය කරමින් සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.

# අක්ෂර වින්‍යාස රීති

## 1. ණ, න භාවිතය

**I. ගණිනවා යන අදහස ඇති විට "ණ" යෙදේ**

- ✓ පරිගණකය
- ✓ ගණිතය
- ✓ ගණකාධිකාරී
- ✓ ගණක යන්ත්‍රය

**II. කිරීම අදහස රැගත් "කරණය" ඇතුළත් වචන වල "ණ" යෙදේ**

- ✓ ශීතකරණය
- ✓ කළමනාකරණය
- ✓ ගෝලීයකරණය
- ✓ නවීකරණය
- ✓ සංස්කරණය
- ✓ ප්‍රතිචක්‍රීකරණය
- ✓ පැස්ටරීකරණය
- ✓ වර්ගීකරණය

**III. "ෂ" කාරයට පසුව "ණ" යෙදේ**

- ✓ දූෂණ
- ✓ භීෂණ
- ✓ ලක්ෂණ
- ✓ තීක්ෂණය
- ✓ පරීක්ෂණය
- ✓ නිරීක්ෂණය
- ✓ සමීක්ෂණය
- ✓ ගවේෂණය

## 2. ල, ළ භාවිතය

**I. 'ර' කාරයෙන් අවසන් වන වර්තමාන කාල ක්‍රියා පද ආශ්‍රයෙන් බිහි වන අතීත කාල ක්‍රියා පදවල "ළ" යෙදේ**

- ✓ කරනවා - කළේ ය
- ✓ ගුගුරනවා - ගුගුළේ ය
- ✓ විචාරනවා - විචාළේ ය
- ✓ වගුරනවා - වගුළේ ය
- ✓ අතුරනවා - අතුළේ ය
- ✓ වදාරනවා - වදාළේ ය
- ✓ මැරෙනවා - මළේ ය
- ✓ දිවුරනවා - දිවුළේ ය

**II. සමූහයක් හැඟවෙන පදවල "ළ" යෙදේ**

- ✓ ඇත් රැළ
- ✓ තුරු පෙළ
- ✓ සොර මුළ
- ✓ බලා වැළ (කොක්කු සමූහය)

(සමූහාර්ථවාචී 'කැල' යන පදයෙහි යෙදෙන්නේ දන්තජ 'ල' කාරය යි.

## 3. ශ,ෂ,ස භාවිතය

### I. 'ක්' ශබ්දයට පසුව "ෂ" යෙදේ

- ✓ අක්ෂරය
- ✓ අක්ෂිදාන
- ✓ භික්ෂුව
- ✓ රක්ෂණය
- ✓ ප්‍රතික්ෂේප
- ✓ පරීක්ෂණය

### II. 'ප' වර්ගයට අයත් අකුරකට මුලින් "ෂ" යෙදේ

- ✓ පුෂ්පය
- ✓ නිෂ්පාදනය
- ✓ නිෂ්ඵල
- ✓ වාෂ්පය

**ලිඛිත අභ්‍යාස**

1. ශ, ෂ, ස අකුරු නිවැරදි ලෙස යොදා හිස්තැන් පුරවන්න.

i. __බ්ද විකා__න යන්ත්‍රයේ හඬ අසා __ෂ්‍ය __ෂ්‍යාවෝ __යලු දෙනා ම නි__ __බ්ද වූහ. විශේ__ නිවේදන කිහිපයක් මෙසේ නිකුත් විය.

ii. පාසල් සංවර්ධන සමිතියේ වාර්__ක රැස්වීම ලබන ඉරිදා __ත සංවත්සර __ලාවේ දී පැවැත්වේ.

iii. දු __කර ගම්මානයක පාසල්වල දරුවන්ට බෙදා දීම සඳහා පු__තකාල පොත් හා අව__ ්‍ය භාණ්ඩ ලබා දීමට කටයුතු කළ පාසලේ කනි__ඨ සිසුන්ට __මස්ත පාසලේ ම ස්තුතිය පුද කෙරේ.

iv. ඉගෙනීමේ දුර්වලතා ඇති දරුවන් වෙනුවෙන් දෙමවුපියන්ගේ පාර්__වයෙන් කෙරෙන කැප වීම නි__චිත ලෙස විනි__චය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට විදුහල්පතිතුමා තීරණය කර ඇත.

- **ලිඛිත අභ්‍යාස**

**1.**

I. ශබ්ද විකාශන යන්ත්‍රයේ හඬ අසා ශිෂ්‍ය ශිෂ්‍යාවෝ සියලු දෙනා ම නිශ්ශබ්ද වූහ. විශේෂ නිවේදන කිහිපයක් මෙසේ නිකුත් විය.

II. පාසල් සංවර්ධන සමිතියේ වාර්ෂික රැස්වීම ලබන ඉරිදා ශත සංවත්සර ශාලාවේ දී පැවැත්වේ.

III. දුෂ්කර ගම්මානයක පාසල්වල දරුවන්ට බෙදා දීම සඳහා පුස්තකාල පොත් හා අවශ්‍ය භාණ්ඩ ලබා දීමට කටයුතු කළ පාසලේ කනිෂ්ඨ සිසුන්ට සමස්ත පාසලේ ම ස්තුතිය පුද කෙරේ.

**IV. ඉගෙනීමේ දුර්වලතා ඇති දරුවන් වෙනුවෙන් දෙමවුපියන්ගේ පාර්ශවයෙන් කෙරෙන කැප වීම නිශ්චිත ලෙස විනිශ්චය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට විදුහල්පතිතුමා තීරණය කර ඇත.**

2. **පහත සඳහන් ඡේදවල අක්ෂර වින්‍යාසය වැරදි තැන් ඇත්නම් ඒවා නිවැරදි කර නැවත ලියන්න.**

   i. “නරකක් කලොත් ලැබෙන විපාකත් නරකයි” සුදු වැලි අතුල බෝ මලුවෙ ඉඳගෙන ගම් වැසියන් කෙරෙහි පතල මහා කරුනාවෙන් බන වදාල ලොකු හාමුදුරුවෝ එසේ කියා දෙසුම අවසන් කලා. ලොකු හාමුදුරුවන්ගෙන් බන දහම් හදාල සුමන පොඩි හාමුදුරුවන් මතුල බුදු ගුන පාටය අහලා ගම්වැසියෝ සාදුකාර දුන්නා.

   ii. රුහුනු පෙදෙසින් වැඩිය ශ්‍රමනයන් වහන්සේ වල් බිහිවුනු පන්සලක් සොයා ගත්තා. විහාරස්තානය යලි නගා සිටුවීමේ අරමුන ඇති උන්වහන්සේ පන්සල් බිමේ බෝදියක් රෝපනය කලා. සාමනේරයන් වහන්සේලා කිහිපනමක් සොයා ගෙන උන්වහන්සේලාට පාලි භාසාව ඉගැන්වීමටත් ගමට ම පරිගනක දැනුම ලබාදිය හැකි මද්‍යස්තානයක් පිහිටුවීමටත් උන්වහන්සේ ඉටා ගත්තා. මේ ස්වාමීන් වහන්සේගේ කලමනාකරනය යටතේ පන්සල දිනෙන් දින දියුනු වුනා; නවීකරනය වුනා.

**7 ශ්‍රේණියේ දී ඉගෙන ගත් අක්ෂර වින්‍යාස රීති ද ඇසුරින් පහත සඳහන් අභ්‍යාසවල යෙදෙන්න.**

3. **පහත සඳහන් වචන නිවැරදි කර නැවත ලියන්න.**

   i. කන්ඩනය  ii. ආක්‍යානය
   iii. ගෝසාව  iv. සංගයා වහන්සේ
   v. චන්දය  vi. පරිච්චේදය
   vii. ගිජ්ජකුටය  viii. ප්‍රතිපල
   ix. බයානක  x. ආබරන

2. **පහත සඳහන් පද්‍ය පාඨවල අක්ෂර වින්‍යාසය නිවැරදි කර නැවත ලියන්න.**

   i. පැරකුම්ඹා නරනිදු සද දකු මිතුර
   ii. පෙරව සද කිරන පිපි කුමුදු මල් වටින්
   iii. රගන ලදුන් බළ රූ සිරි සියල්ලා
   iv. කදවුරු කුළ මැඳුරු මිනි පහණෙව් සුසැදි

**2.**

I. "නරකක් කළොත් ලැබෙන විපාකත් නරකයි" සුදු වැලි අතුළ බෝ මළුවෙ ඉඳගෙන ගම් වැසියන් කෙරෙහි පතළ මහා කරුණාවෙන් බණ වදාළ ලොකු හාමුදුරුවෝ එසේ කියා දෙසුම අවසන් කළා. ලොකු හාමුදුරුවන්ගෙන් බණ දහම් හදාළ සුමන පොඩි හාමුදුරුවන් මතුළ බුදු ගුණ පාඨය අහලා ගම්වැසියෝ සාධුකාර දුන්නා.

II. රුහුණු පෙදෙසින් වැඩිය ශ්‍රමණයන් වහන්සේ වල් බිහිවුණු පන්සලක් සොයා ගත්තා. විහාරස්ථානය යළි නගා සිටුවීමේ අරමුණ ඇති උන්වහන්සේ පන්සල් බිමේ බෝධියක් රෝපණය කළා. සාමණේරයන් වහන්සේලා කිහිපනමක් සොයා ගෙන උන්වහන්සේලාට පාලි භාෂාව ඉගැන්වීමටත් ගමට ම පරිගණක දැනුම ලබාදිය හැකි මධ්‍යස්ථානයක් පිහිටුවීමටත් උන්වහන්සේ ඉටා ගත්තා. මේ ස්වාමීන් වහන්සේගේ කළමනාකරණය යටතේ පන්සල දිනෙන් දින දියුණු වුණා; නවීකරණය වුණා.



**3.**

| | | |
|---|---|---|
| I. කන්ඩනය | - | ඛණ්ඩනය |
| II. ආක්‍යාතය | - | ආඛ්‍යාතය |
| III. ගෝසාව | - | ඝෝෂාව |
| IV. සංගයා වහන්සේ | - | සංඝයා වහන්සේ |
| V. චන්දය | - | ඡන්දය |
| VI. පරිච්චේදය | - | පරිච්ඡේදය |
| VII. ගිජ්ජකූටය | - | ගිජ්ඣකූටය |
| VIII. ප්‍රතිපල | - | ප්‍රතිඵල |
| IX. බයානක | - | භයානක |
| X. ආබරන | - | ආබරණ / ආභරණ |

**4.**

I. පැරකුම්ඹා නරනිදු සද දකු මිතුර
පැරකුම්බා නරනිඳු සඳ දකු මිතුර

II. පෙරව සද කිරන පිපි කුමුඳු මල් වටින්
පෙරව සඳ කිරණ පිපි කුමුදු මල් වටින්

III. රගන ළදුන් බළ රූ සිරි සියල්ලා
රඟන ළඳුන් බල රූ සිරි සියල්ලා

IV. කදවුරු කුළ මැඳුරු මිනි පහණෙව් සුසැදි
කඳවුරු කුල මැදුරු මිණි පහනෙව් සුසැඳි

# ගුරු අත් පොතෙන්

## ගුණාත්මක යෙදවුම්

- විවිධ රටවල සංස්කෘතික උත්සව නිරූපණය කෙරෙන චිත්‍රයක් හෝ කිහිපයක්
- විවිධ උත්සවවල චාරිත්‍ර - වාරිත්‍ර ඉටු කෙරෙන අවස්ථා දැක්වෙන ඡායාරූප, පින්තූර හෝ වීඩියෝ දර්ශනයක්
- සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය 2015) - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල අක්ෂර වින්‍යාස ආකාරාදිය - සඳගෝමි කෝපරහේවා



NALANDA VIDYALAYA NALANDA VIDYALAYA
NALANDA VIDYALAYA NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

**8 ශ්‍රේණිය** | **සිංහල භාෂාව** | **ඒකකය: 3 - අලුත් අවුරුදු උත්සවය**

1) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
 1) පාඩමේ සඳහන් වන අලුත් අවුරුදු චාරිත්‍ර පිළිවෙළින් ලියන්න.
 2) අලුත් අවුරුදු ක්‍රීඩා නම් කරන්න.
 අලුත් අවුරුදු ක්‍රීඩා කිරීමේ අර්ථය ලෙස ඔබ දකින්නේ කුමක් ද?
 3) අලුත් අවුරුදු උත්සවය හැරුණු කොට ශ්‍රී ලංකාවේ පවත්වන වෙනත් සංස්කෘතික උත්සව මොනවා ද?

2) පහත සඳහන් උද්ධෘත කා විසින් කියන ලද්දේද? කා හට කීවා ද? සහ අවස්ථාව? වගුවක් මගින් ලියා දක්වන්න.

| | උද්ධෘතය | කීවේ කවුද? | කාටද? | අවස්ථාව |
|---|---|---|---|---|
| 1) | ''මේ ලිතේ වැදගත් දේවල් ගොඩක් තියෙනවා පුතේ'' | | | |
| 2) | ''හෙට උදේ දහයයි විසිතුනට තමයි අලුත් අවුරුදු උදාව සිද්ධ වෙන්නෙ'' | | | |
| 3) | ''ඒ කතාව හරියට ම හරි පුතේ. අපි කාටත් විවේකය ඕනෑ'' | | | |
| 4) | ''සීයේ, මේ ලිතේ තියෙන නානු කියන්නේ මොනවාද?'' | | | |
| 5) | ''තාත්තේ, අපි අවුරුද්දට කරන ක්‍රීඩා අතරෙත් තියෙනවද පිටරටවලින් ආපු ක්‍රීඩා?'' | | | |

3) පහත සඳහන් වචන නිවැරදි කර නැවත ලියන්න.
 1) පරිසනකය
 2) ගනකාධිකාරි
 3) කලේය
 4) ශීතකරනය
 5) දූශන
 6) තීක්ෂන
 7) පුෂ්ඵය
 8) නිෂ්පල
 9) අක්ශරය
 10) ප්‍රතික්ශේප

4) ' සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද ' යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.

**සැකසුම : G.R.N. රාමවික්‍රම මිය**

# පිළිතුරු



**Answer**

1.

I. නව සඳ බැලීම, පරණ අවුරුද්ද සඳහා ස්නානය, අලුත් අවුරුදු උදාව, පුණ්‍ය කාලය, ආහාර පිසීම, වැඩ ඇල්ලීම, ගනුදෙනු කිරීම හා ආහාර අනුභවය, හිසතෙල් ගෑම. රැකී රක්ෂා සඳහා පිට වී යෑම.

II. කැට ගැසීම, පන්දු ගැසීම, එල්ලේ ගැසීම, පොරපොල් ගැසීම, වළකජු ගැසීම, පංච දැමීම, ගල් කිරීම, ඔළිඳ කෙළිය, ඔංචිලි පැදීම, නෙරංචි ඇදීම, එළුවන් කෑම, කිලි තට්ටු, කිට්ටිපුල්ලු, වාර්ඕට්ටම්, රබන් ගැසීම

III. යාළු මිත්‍රයන්, නෑදෑයන්, අසල 'වැසියන් සමඟ සෙල්ලම් කිරීමෙන් ඔවුන් අතර ඇති එකමුතුකම වැඩි වේ.

2.

I. සීයා විසින් මුණුබුරාට/ කථකයාට: සීයා පඤ්චාංග ලිත බලමින් සිටි අවස්ථාවේ.

II. සීයා විසින් මුණුබුරාට/ කථකයාට: අලුත් අවුරුද්ද උදා වෙන්නෙ කීයට දැයි ඇසූ අවස්ථාවේ.

III. සීයා විසින් මුණුබුරාට/ කථකයාට: කථකයා විසින් විදුහල්පතිතුමා කතාවක දි නොනගතේ ගැන කියූ දේ සීයාට ප්‍රකාශ කළ අවස්ථාවේ.

IV. මුණුබුරාට/ කථකයා විසින් සීයා ට: කථකයා ලිතේ සඳහන් පරණ අවුරුද්ද සඳහා ස්නානය ගැන අසන අවස්ථාව.

V. පුතා/ කථකයා විසින් තාත්තා ට: බටහිර ජාතීන් හඳුන්වලා දුන්න අවුරුදු කෑම මේසෙ තියෙන කෑම වර්ග ගැන තාත්තා විසින් විස්තර කළ අවස්ථාවේ.

3.

I. පරිඝනකය - පරිගණකය
II. ගනකාධිකාරි - ගණකාධිකාරි
III. කලේය - කළේය
IV. ශීතකරනය - ශීතකරණය

V. දූශන - දූෂණ
VI. තීක්ෂන - තීක්ෂණ
VII. පුෂ්ඵය - පුෂ්පය
VIII. නිෂ්පල - නිෂ්ඵල
IX. අක්ශරය - අක්ෂරය
X. ප්‍රතික්ශේප - ප්‍රතික්ෂේප

4. <u>'සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද'</u>

සෑම වසරකම බක් මාසයේ සූර්යය සංක්‍රාන්තියත් සමග එනම් සූර්යයා මීන රාශියෙන් මේශ රාශියට ගමන් කිරීමත් සමග නව සිංහල හා හින්දු අලුත් අවුරුද්ද උදා වෙයි. මෙම සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද අතීතයේ සිටම ශ්‍රී ලංකාවේ පැවති මහා සංස්කෘතික කලා මංගල්‍යයකි. කෘෂිකාර්මික කටයුතු හා බැඳුණු විශ්වාස, චාරිත්‍ර වාරිත්‍ර, ආගමික කටයුතු අවුරුද්දත් සමග බැදී පවතී. අලුත් අවුරුද්දේ බෞද්ධයින් සිය ආගමික කටයුතු වලට මුල්තැන දෙමින් අවුරුද්ද සමරන අතර, හින්දු භක්තිකයින්ද ඔවුන්ගේ ආගමට අනුව අවුරුද්දේ චාරිත්‍ර වාරිත්‍ර ඉටු කරති.

වර්තමානයේ අවුරුදු දින සිරිත් විරිත් ඉටු කිරීම සාම්ප්‍රදායිකව නක්ෂත්‍රකරුවන් විසින් ලබාදෙන නැකැත් වේලාවන් අනුව කරනු ලබන අතර අලුත් අවුරුදු උදාව සැමරීම ස්වදේශීය බෞද්ධ හා හින්දු සම්ප්‍රදායන් වල සංකීර්ණ එකතුවක් ලෙස සලකනු ලබයි.

බක් මාසයේ උදාවත් සමග ගහකොළ පරිසරය පවා අවුරුද්දට සැරසෙන ආකාරයක් කියා පාමින් නැවුම් සිරියක් ගන්නා අතර එය ජනතාවගේ සිත් තුළද නව අවුරුදු උදාව සහ නව බලාපොරොත්තු පිළිබදව හැඟීමක් ජනිත කරවීමට සමත් වෙයි. කොවුලාගේ කෑ ගැසීම, එරබදු මල් රතට පිපීම මෙන්ම ගහකොළ මලින් ඵලයෙන් බරවීම අවුරුදු අසිරිය කියාපාන්නකි. අලුත් අවුරුදු උත්සව සමය තුල ළමුන් මෙන්ම වැඩිහිටියන්ද සම්ප්‍රදායික ඇඳුමින් සැරසී නෑදෑ හිතමිතුරන් සමඟ ප්‍රීතිමත් වනු දැකිය හැකිය. එක් එක් චාරිත්‍රය ඉටු කිරීම සඳහා සුභ මොහොත උදාවූ බව සංඥා කරනු ලබන්නේ රබන් ශබ්දය හඬ මගිනි. ගෘහණිය නිවසේ අවුරුදු කෑම මේසයට කිරිබත්, කැවුම්, කොකිස්, කෙසෙල් අනිවාර්යයෙන්ම පිළියෙල කර ගනියි. නැකතට ආහාර අනුභව කිරීම, වැඩ ඇල්ලීම, ගණුදෙනු කිරීම හා හිස තෙල්ගෑම අලුත් අවුරුදු උදාවෙන් පසුව සිදු කරන මූලික චාරිත්‍ර වේ.

මෙම වැදගත් චාරිත්‍ර ඉටු කිරීමෙන් පසුව සියලු දෙනා මාර්ගයේ, නිවෙස්වල හෝ එකට එකතු වී අවුරුදු ක්‍රීඩා වල යෙදෙති. පංච කෙළිය, ඔන්චිලි වාරම්, ඔළිඳ කෙළිය, රබන් ගැසීම ඉන් කිහිපයකි. ඊට අමතරව එළිමහනේ අවුරුදු ක්‍රීඩා උත්සව පැවත්වීම සඳහා ගම්වැසියන් සියලු දෙනා දායක වෙති.කොට්ට පොර ගැසීම, පොර පොල් ගැසීම, ලිස්සන ගහේ නැගීම,කඹ ඇදීම, අවුරුදු කුමරිය තේරීම වැනි තරඟ ඉසව් වලට මෙහිදී මුල් තැන හිමි වේ. බොහෝ විට නාගරික ජන ජීවිතය තුලට වඩා ගැමි සමාජය තුල අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර වලට මුල්තැන දීමත් අවුරුදු උත්සව පැවත්වීමත් සියලු දෙනා සහයෝගයෙන් කටයුතු කරන ආකාරයත් දැකිය හැකිය.

අලුත් අවුරුද්ද ශ්‍රී ලාංකික සිංහල බෞද්ධයින්ට හා දෙමළ හින්දු ආගමිකයින්ට ඉතා වැදගත් ජාතික නිවාඩු දිනයකි. සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සමාජ සම්බන්ධතා වැඩි දියුණු වීමටත් පැරණි සිරිත් විරිත් නොනැසී ඉදිරියට පවත්වාගැනීමටත් එකිනෙකා අතර අන්‍යෝන්‍ය විශ්වාසය වැඩි දියුණු වීමටත් ඉවහල් වේ.

මෙවර ලෝකයටම අභියෝගයක්ව පවතින කොවිඩ් වසංගතයත් සමග ගියවසරේ මෙන්ම යම් යම් සීමාවන්ට යටත්ව අවුරුදු සැමරීමට වීම ශ්‍රී ලාංකිකයන් වන අපද මුහුණපා සිටින අභියෝගයකි. කෙසේ වුවද සෞඛ්‍යාරක්ෂාවට මුල්තැන දෙමින් සෞඛ්‍ය නීති රීතීන් නිරන්තරයෙන් පිළිපදිමින් උදාවූ අලුත් අවුරුද්ද සැමරීමට අප සියලු දෙනා කටයුතු කරමු. සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සාමය සතුට මෙන්ම නීරෝගීභාවය ද සපිරි සිරි සුභ අලුත් අවුරුද්දක් වේවා..!



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප **3in1 Youtube** නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තූතියි !**

**හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



**3 in 1 youtube** නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ